





මාළිගාවිල බුද්ධ ප්‍රතිමාව

## ⁂ මිනිස් දිවියෙන් උපරිම පල ලබන හැටි

– මාදුළුවාවේ සෝභිත හිමි

මනුෂ්‍ය ජීවිතයක් ලබා ගැනීමේ දුෂ්කරතාව හා එයින් උපරිම ඵල ලබන ආකාරය, වෙසක් පුර පසළොස්වක පෝද ධර්ම දේශනාවෙන් ජීවිතය හා ඊට දක්විය යුතු හොඳම ප්‍රතිචාරය පිළිබඳ යථා දර්ශනයක් ප්‍රකට වී ඇති මොහොතක – මිනිස් බුද්ධියෙන් ඉන් නිසි ඵල ලැබීමට උත්සාහ කිරීමේ වැදගත්කම.

## ⁂ සම්බුදු තෙමඟුල

– බෙල්ලන ඤාණවිමල මහ නාහිමි

සිදුහත් බෝසත් කුමරු මෙලොව උපත ලැබීම – ගිහි ගෙයින් නික්මී ගොස් සය වසරක විමුක්ති ගවේෂණ වැඩ පිළිවෙළකින් පසු බුද්ධත්වය ලැබීම හා හතළිස් පස් වසරක සුවිශාල සමාජ මෙහෙවරකින් පසු පිරිනිවන් පෑම යන ත්‍රිවිධ කරුණු සිදුවූ වෙසක් දින සැමරුම වෙනුවෙන් ඒ පිළිබඳ ලියැවුණු විශේෂ ලිපියකි.

## ⁂ සත්හට වන බව දුකට වෙදාණන්

– පොත්තේවෙල බුද්ධරක්ඛිත නාහිමි

සංසාර රෝගයට මනා සේ පිළියම් කළ බැවින් 'බව දුකට වෙදණන්' නමින් හැඳින්වෙන බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂ හෘස්තෘත්වය අගැයීමට ලක් කිරීමකි. මානව ප්‍රජාවේ විමුක්තිය වෙනුවෙන් බුදුරදුන් අතින් ඉටු වූ සුවිශේෂ මෙහෙවර පිළිබඳ විමර්ශනයකි.

## ⁂ දුක්ඛ සත්‍යය

– කොස්වත්තේ අරියවිමල හිමි

ජීවිතය පිළිබඳ සැබෑ තත්ත්වය වශයෙන් බුදු වදනෙන් දේශිත දුක් සහිත සංසාර ගමනෙහි යථාර්ථය පැහැදිලි කැරෙන බුදු දහමෙහි දක්වෙන 'ආර්ය සත්‍ය' සතරෙන් පළමු සත්‍ය වශයෙන් දක්වෙන 'දුක්ඛ ආර්ය සත්‍යය' පිළිබඳ විමර්ශනයකි.

## ⁂ සමුදය සත්‍යය

– දේවාලේගම මේධානන්ද හිමි

'සංසාරය' නමැති දුක් සහිත පැවැත්මට ආසන්න හේතුව වශයෙන් බුද්ධ දේශනාවෙන් පෙන්වා දී ඇති ආර්ය සත්‍ය සතරෙහි දෙවැනියට සඳහන් වන 'දුක්ඛ සමුදය ආර්ය සත්‍යය' හෙවත් 'තණ්හාව' පිළිබඳ විමර්ශනයකි.

## ⁂ දුක්ඛ නිරෝධයෙහි ස්වභාවය

– මීගොඩ පඤ්ඤාලෝක හිමි

ජීවිතය පිළිබඳ සමස්ත ගැටලුවට එකම ස්ථිරසාර විසඳුම වශයෙන් බුදු දහමෙන් දක්වා ඇති; ආර්ය සත්‍ය සතරෙන් තුන් වැනි සත්‍යය ලෙස සඳහන් වන 'නිරෝධ සත්‍යය' හෙවත් 'නිර්වාණය' පිළිබඳ ධර්මානුකූල විවරණයක් සැපයීමට කරන උත්සාහයකි.

## ⁂ අගනා වෙසක් සැරසිල්ල

– මුරුංගාස්යායේ ඤාණිස්සර නාහිමි

බුදුරදුන් ගේ ජීවිතය පිළිබඳ වැදගත් කරුණු තුනක් සිහිපත්කරන වෙසක් සැමරුම සිදු කළ යුතු නිසි පිළිවෙල පෙන්වා දීමට උත්සාහ කරන ලිපියකි මේ. ගුණ දහමෙන් සිත සරසා ගැනීම නම් වූ ප්‍රතිපත්ති පූජාව – වෙනත් විවිධ සැරසිලි සහිත වූ ආමිස පූජාවලට වඩා බෙහෙවින් උසස් බුද්ධ පූජාවක් බව පෙන්වා දීම ලේඛකයා ගේ අරමුණයි.

## ⁂ අනන්‍යතාව මෙනෙහි කිරීම

– කොටපොළ අමරකිත්ති හිමි

විමුක්තියේ දහමට සවන් දෙමින් – ඒ දහම තමන්ගේ දහම නැත්නම් තමන් පිළිගත් දහම කරගත් බොදුනුවන් – තමන්ගේ ඒ 'අනන්‍යතාව' නිතර සිහිපත් කිරීමේ වැදගත්කම. ලෝකෝත්තර වශයෙන් ප්‍රගතියක් ලැබීම සඳහා ද. ජීවිත සාර්ථකත්වය සඳහා ද තමන් යා යුතු මග පිළිබඳ අඛණ්ඩ අවධානයකින් සිටීමේ වැදගත්කම

## මිහිකත සැනැසූ සත් පියවර

සිදුහත් උපත පිළිබඳ තොරතුරු ඇතුළත් විමර්ශනයකි. දිගු කලක් සසර පෙරුම් දම් පිරූ පුද්ගලයකු තුළ පවතින සුවිශේෂ කුසල ශක්තිය ප්‍රකට කළ සිදුවීමක් වන සිදුහත් කුමරුගේ උපත පිළිබඳ ධර්මානුකූල විග්‍රහයක් ඉදිරිපත් කිරීමට දරන උත්සාහයකි.

## බුදුරදුන්ගේ ප්‍රථම උදානය

වෙසක් පුර පෝ දිනක බුද්ධත්වයට පත්වී තමන් සසර දුකෙන් නිදහස් වීම පිළිබඳ ප්‍රීතිය ප්‍රකාශයට පත්කළ – බුදුරදුන්ගේ ප්‍රථම උදානය පිළිබඳ විමර්ශනයක් ඇතුළත් ශාස්ත්‍රීය ලිපියකි.

## වෙසක් උත්සවයට මුද්දර හතරක්

වෙසක් උත්සවය නිමිති කරගෙන ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද මුද්දර හතරක් පිළිබඳ ප්‍රවෘත්ති ඡායාරූප කිහිපයකි.

## බුදුදහම හා වෙනත් ආගම්

– බෙලිගල්ලේ ධම්මජෝති හිමි

විවිධ ආගම් මගින් ලෝක ප්‍රජාවට සැලසුණු විවිධාකාර යහපත් ප්‍රතිඵල සහ එම ආගම් හා බුදු දහම අතර දක්නට ලැබෙන විවිධ සමානතා සාකච්ඡා කැරෙන ලිපියකි.

## බුදු ගුණ සුවඳ විහිදෙන භාරත බෞද්ධ සිද්ධස්ථාන

බුද්ධ චරිතය හා බුද්ධ ශාසනය පිළිබඳ සුවිශේෂ සිදුවීම් රැසක් සිදු වූ ස්ථාන ලෙස සැලකෙන භාරතයේ බෞද්ධ පූද බිම් ගැන තොරතුරු රැගත් ලිපියෙකි.

## අසම සම බුදුගුණ

දගු කලක් සසර පුරා ගුණ දම් හා කුසලතා වර්ධනය කොටගෙන බුද්ධත්වය ලද ගෞතම බුදු හිමියන් තුළ දක්නට ලැබුණු උතුම් ගුණ සමුදයයෙන් බිඳක් – විමසුමට ලක් කිරීමට දරන උත්සාහයකි.

## අනුරපුර යුගයේ වෙසක් උත්සව

– සිරිපාල මාදුවගේ

අතීතයේ ශ්‍රී ලංකාවේ රාජ්‍යය කළ විවිධ රජවරුන් විසින් පවත්වන ලද වෙසක් උත්සව පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇතුළත් ලිපියෙකි.

## සිරි සඟබෝ භාවනා මධ්‍යස්ථානය

වෙසක් උත්සව සමයේදී අනුරාධපුර ශුද්ධ නගරයේ වන්දනාවට පැමිණෙන බැතිමතුන්ගේ අවධානය යොමු වීම සඳහා පළකැරෙන අනුරපුර සිරිසඟබෝ භාවනා මධ්‍යස්ථානය තුළ ඉදිකරුණු අලංකාර අසූ මහා ශ්‍රාවක විහාරය පිළිබඳ වර්ණවත් විශේෂාංගයකි.

## රූපයක් නැත්තාගේ රූපය

– මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ

බුදු ගුණ සංකේතවත් කිරීම සඳහා එදා සිට බොදුනුවන් විසින් යොදාගනු ලැබූ විවිධ සංකේත පිළිබඳ විමසුමෙකි. එම සංකේත නිර්මාණය වූ අයුරු හා ඒවායේ ආගමික හා කලාත්මක වටිනාකම් පිළිබඳ කරුණු මේ ලිපිය තුළ සාකච්ඡාවට ලක් වෙයි

## .අසිරිමත් සිරිතේ අසිරිමත් පාඩම්

– බී. ඒ. විමලසේන

බුදු සිරිතේ දක්නට ලැබුණු සුවිශේෂ පිළිවෙත් හා ගුණ දහම් පිළිබඳ විවරණයකි. සමකාලීන අනෙකුත් ආගමික ශාස්තෲවරුන් අතර කැපී පෙනුණු විශිෂ්ට චරිත ලක්ෂණ හිමි බුදුරදුන්ගේ ආදර්ශවත් හාස්‍යතෘත්වය නිසා මානව සමාජයට සැලසුණු සුවිශාල යහපත.

## බෞද්ධ භාවනා ක්‍රම

– නාඋයනේ අරියධම්ම හිමි

බුද්ධ දේශනාව තුළ දැක්වෙන භාවනා ක්‍රම පිළිබඳ විමර්ශනයකි. බෞද්ධ භාවනා යනු කුමක්ද? සමථ– විදර්ශනා යනු කුමක් ද? සමථ භාවනා කීයද? සමථ භාවනාවේඅනුහස් මොනවාද? විදර්ශනා ඥාණ කොපමණද? විදර්ශනාවේ අනුසස් මොනවාද? යන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට ලේඛකයා මෙම ලිපියෙන් උත්සාහ කරයි

## මාර්ග සත්‍යය

– කිරිබත්ගොඩ ඥාණානන්ද හිමි

ජීවිතය පිළිබඳ යථාර්ථයට දැක්විය යුතු හොඳම ප්‍රතිචාරය වශයෙන් නිර්දේශිත දහම් මග; නැතහොත් සසර දුකෙන් මිදීම සඳහා පිළිපැදිය යුතු ප්‍රතිපදා මාර්ගය දැක්වෙන ආර්ය සත්‍ය සතරෙහි – සතර වැනි සත්‍යය වශයෙන් සඳහන් වන ‘මාර්ග සත්‍යය’ පිළිබඳ විමර්ශනයකි

## බෞද්ධ ජීවිතය සකස් කර ගන්නේ කෙසේද?

– මකුලෑවේ විමල හිමි

පාපයෙන් හා අකුසලයෙන් බැහැර වී ගුණ දහමට – කුසලයට – පිනට නැඹුරු වූ ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම, මෙ ලොව ජීවිතය මානසික සුවයෙන් යුතු ව ගත කිරීමටත්, අප්‍රමාදී ව විමුක්තිය සාක්ෂාත් කර ගැනීමටත්, කුසල ප්‍රතිපදාවෙන් ලැබෙන දායකත්වය.

## බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනම

– බී.ඒ. ටෙනිසන් පෙරේරා

පුද්ගලයාගේ සාමාජීක වටිනාකම වැඩි වීමට හා මිනිස් සමාජයේ සාමූහික ප්‍රගතිය ඇති වීමෙහිලා බුදු දහමෙහි දාර්ශනික උපයෝගීතාව දක්නට ලැබෙන සමාජ විද්‍යාත්මක වටිනාකම මෙම ලිපියෙන් ගෙන හැර දැක්වේ.

## Bodhisatta Setaketu down to earth

***-by Aryadasa Ratnasinghe***